# ශ්‍රී ලංකා වරාය අධිකාරිය

මගේ අංකය: වඅධි/ප්‍ර01/චක්‍රලේඛ/2025

වරාය අධිකාරියේ චක්‍රලේඛ අංක: 01 /2025

**සියළුම සේවක මහත්ම මහත්මීන් වෙත**

**මාර්ගගත ක්‍රමය (Online) මගින් නිවාඩු නිකේතනවල/ සංචාරක බංගලාවල කාමර/ශාලා වෙන් කිරීම හා ගාස්තු සංශෝධනය කිරීම**

---

වරාය අධිකාරියේ චක්‍රලේඛ අංක 21/2024 අනුව 2024.08.01 දින සිට මාර්ගගත ක්‍රමය ඔස්සේ නිවාඩු නිකේතනවල/ සංචාරක බංගලාවල කාමර/ශාලා වෙන් කරවා ගැනීම් සිදු කරනු ලබයි..

එබැවින්, වත්මන් රජයේ ප්‍රතිපත්තිය හා මාර්ගගත ක්‍රමය මගින් නිවාඩු නිකේතනවල/ සංචාරක බංගලාවල කාමර/ශාලා වෙන් කරවා ගැනීම යන කරුණු සැලකිල්ලට ගෙන ලේකම් කාර්යාලීය චක්‍රලේඛ අංක 01/2023 හි සඳහන් නීති/රීති/උපදෙස් පහත පරිදි සංශෝධනය කරනු ලබන බව දන්වමි.

1. වරාය අධිකාරියේ සේවයේ නියුතු නිලධාරීන්/ සේවකයින් සඳහා නිවාඩු ගත කිරීමට හෝ රාජකාරී කටයුත්තක් වෙනුවෙන් වරාය අධිකාරියට අයත් නිවාඩු නිකේතනයක/ සංචාරක බංගලාවක කාමර/ ශාලා වෙන් කරවා ගැනීම සඳහා වෙන් කර ගැනීමට අපේක්ෂිත දිනට දින 33 කට පෙර පරිගණක පද්ධතිය මගින් ඉල්ලුම් කළ හැක.

   තවද, රාත්‍රී දෙකක් (02) සඳහා නිවාඩු නිකේතනවල කාමර/ ශාලා එකවර ඉල්ලුම් කිරීමට හැකියාව පවතින අතර ඒ සඳහා ලේකම් කොට්ඨාශය/ සු. හා කා.ස. කොට්ඨාශය යන කොට්ඨාශ ප්‍රධානීන්ට හෝ අංශ ප්‍රධානීන්ට අනුමැතිය ලබා දීමට හැකිය.

2. වරාය භාර අමාත්‍යාංශයේ සේවය කරන කාර්ය මණ්ඩල ඇතුළුව වරාය අධිකාරියේ සේවාවන් හා සෘජු සම්බන්ධතාවයක් ඇති රාජ්‍ය ආයතනවල නිලධාරීන්ටද කාමර වෙන්කර ගැනීමට හැකියාව ඇති අතර ඔවුන් විසින් කාමර වෙන් කිරීමට අපේක්ෂිත දිනට දින 17 කට පෙර පරිගණක පද්ධතිය මගින් ඉල්ලුම් කිරීමට හැකියාව ඇත.

3. වරාය අධිකාරියේ සේවයෙන් විශ්‍රාම ගොස් ඇති නිලධාරී/ සේවකයින් සඳහා නිවාඩු නිකේතනයක/ සංචාරක බංගලාවක කාමර/ ශාලා වෙන් කර ගැනීමට හැකි අතර ඔවුන්ටද කාමර වෙන් කිරීමට අවශ්‍ය දිනට දින 17 කට පෙර පරිගණක පද්ධතිය මගින් ඉල්ලුම් කිරීමට හැකියාව ඇත.

4. නිවාඩු නිකේතනවල කාමර/ශාලා වෙන් කිරීමට අවශ්‍ය දිනට දින 33 කට පෙර බංගලා වෙන් කිරීමේ පද්ධතිය (Bungalow Booking System) විවෘත වන අතර එම පද්ධතිය මගින් ඉල්ලුම් කිරීමට හැකියාව ඇත්තේ විවෘත වූ දින උදේ 09.00 සිට වේ.

5. වරාය අධිකාරියට අයත් සියළුම නිවාඩු නිකේතනවල/සංචාරක බංගලා/ ශාලා වෙන් වෙන් වශයෙන් පරිගණක පද්ධතියට ඇතුළත් කර ඇති අතර SLM3 වැටුප් කාණ්ඩය හා ඊට ඉහළ වැටුප් කාණ්ඩවල නිලධාරීන්ට ඔවුන්ට වෙන් කර ඇති කාමර හා අනෙකුත් කාමර ඉල්ලුම් කිරීමටද අනෙකුත් සියළුම නිලධාරීන්/ සේවකයින්ට ඉහත සඳහන් නිලධාරීන්ට වෙන් කර නොමැති අනෙකුත් කාමර ඉල්ලුම් කිරීමට හැකිය.

6. විෂයභාර අමාත්‍යවරයා/ නියෝජ්‍ය අමාත්‍යවරයා, වරාය අමාත්‍යාංශයේ ලේකම්/ අතිරේක ලේකම්වරුන්ට, වරාය අධිකාරියේ සභාපති, උප සභාපති, කළමනාකාර අධ්‍යක්ෂට ගාලු කොටුවේ පිහිටි ආකස්ලූට් සංචාරක බංගලාව වෙන් කරවා ගැනීමට හැකියාව ඇත.

7. වරාය අධිකාරියේ කොට්ඨාශ ප්‍රධානී හා ඊට ඉහළ නිලධාරීන්ට හා වරාය අමාත්‍යාංශයේ සහකාර ලේකම්වරු හා ඒ ආශ්‍රිත ශ්‍රේණිවල නිලධාරීන්ට රුමස්සල VVIP සංචාරක බංගලාව වෙන් කරවා ගැනිමට හැකියාව ඇත.

8. ඉල්ලුම් කරනු ලබන කාමර/ ශාලාවල නතර වීම සඳහා යන පුද්ගලයින්ගේ අනන්‍යතාවය තහවුරු කර ගැනීම සඳහා ඒ අයගේ සම්පූර්ණ නම්, ජාතික හැඳුනුම්පත් අංක, අධිකාරිය මගින් නිකුත් කර ඇති අනන්‍යතා ලාංඡන අංක සහ අයදුම්කරු කැටුව යන අයවලුන්ට ඇති ඥාති සම්බන්ධතාවය **ඩිජිටල් අයදුම්පතෙහි** පැහැදිලිව සඳහන් කළ යුතුය.

9. කාමර/ ශාලා වෙන් කර ගැනීම අනුමත වූ බව පරිගණක පද්ධතිය මගින් ලැබෙන e-mail පණිවුඩය අනුව ලංකා බැංකුවේ අංක 0000001549 දරණ ගිණුමට අදාළ ගෙවීම් සිදු කර කුවිතාන්සිය පරිගණක පද්ධතියට upload කළ යුතුය. ගෙවීම් කිරීමට දැනුම් දීමේ පණිවිඩය ලද දින සිට පැය 72 ක් තුළ **අදාළ ගෙවීම් කුවිතාන්සිය upload නොකළ හොත් වෙන් කරවා ගැනීම ස්වයංක්‍රීයව අවලංගු වන අතර එම දිනයන් වෙනත් අයෙකුට අයදුම්කිරීමට හැකියාව ලැබෙනු ඇත.**

10. කාමර වෙන් කර ගත් දිනයන්හිදී ඇතුළත් වන දිනයේදී ප.ව. 2.30 ට පසුව (checking time) ඇතුළත් වීම හා පිටත් වන දිනයේදී ප.ව. 12.30 ට පෙර පිටත් වීම (cheekout-time) සිදු කළ යුතුය.

11. නිවාඩු නිකේතනවල වෙන් කරන ලද කාමර/ විවෘත ශාලා අයදුම්පතේ සඳහන් කර අනුමැතිය ලබා ගත් පුද්ගලයින්ට පමණක් නැවතීම සඳහා අවසර දෙනු ලැබේ.

12. අනුමත කරන ලද පුද්ගලයින් සංඛ්‍යාව ඉක්මවා කිසිදු අයෙකුට කිසිම හේතුවක් නිසාවත් නිවාඩු නිකේතනවල නවාතැන් ගැනීමට අවසර නොමැත.

13. කිසියම් අයදුම්කරුවෙකු විසින් වෙන්කර ගනු ලබන කාමර/ ශාලා වෙනත් අයගේ පාවිච්චිය සඳහා පැවරිය නොහැක.

14. **කාමර වෙන් කරවා ගෙන ඉහත (09) වන වගන්තිය අනුව ගෙවීම් කටයුතු සිදු කිරීමෙන් අනතුරුව එම වෙන් කිරීම් අවලංගු කර නැවත මුදල් ලබාගත නොහැක.**

15. එක කාමරයක නතර වීම සඳහා අවසර දෙනු ලබන්නේ වැඩිහිටියන් දෙදෙනෙකුට හා වයස අවුරුදු 12ට අඩු ළමුන් දෙදෙනෙකුට පමණි. එම සීමාව ඉක්මවා කාමර වල නැවතීමට ඉඩකඩ සලසා දෙනු නොලැබේ.

16. කතරගම නව විශ්‍රාම ශාලාවේ අංක 1 දරණ ගොඩනැගිලි සංකීර්ණයේ විවෘත ශාලා දෙකක් ඇති බැවින් කණ්ඩායම් වශයෙන් පැමිණෙන සේවක මහත්ම මහත්මීන් සඳහා එම ශාලා වෙන් කරවා ගත හැකිය.

17. අංක 16 හි සඳහන් විශ්‍රාම ශාලාවේ අංක 1 දරණ ගොඩනැගිලි සංකීර්ණයේ ඇති කාමර/ ශාලාවල නවාතැන් පහසුකම් ලබා ගන්නා අය සඳහා අවශ්‍ය ආහාර පාන ආදිය තමන්ට පිළියෙල කර ගැනීම සඳහා මුළුතැන්ගෙවල් පහසුකම් ද සපයා ඇත. ආහාර පිසීම සඳහා අවශ්‍ය උපකරණ හා භාජන තාවකාලික පදනම මත බංගලා භාරකරුගෙන් ලබා ගත හැකිය.

18. ඉහත අංක 17 වගන්තියේ සඳහන් පරිදි ලබා ගන්නා ලද භාණ්ඩ ඉතා පරෙස්සමින් පරිහරණය කළ යුතු අතර, යම් අලාභ හානියක් සිදුවුවහොත් හෝ අස්ථානගත වීමක් වුවහොත් **අලාභය අයදුම්කරුගෙන් අය කර ගනු ලැබේ.**

19. කාමර/ශාලාවල නවාතැන් ගන්නා පිරිස් ඒ ඒ කාමර/ශාලා සඳහාම වෙන් කර ඇති වැසිකිළි හා නාන කාමර පමණක් පරිහරණය සඳහා යොදා ගත යුතුය. එමෙන්ම මේවා පිරිසිදුවටත්, පිළිවෙලටත් තබා ගැනීම සඳහා නවාතැන්කරුවන් වග බලා ගත යුතු වේ. එලෙසම ඒවායේ සවිකර ඇති උපකරණ, භාණ්ඩ වලට හානි නොවන ලෙස පරිහරණය කිරීමට කටයුතු කළ යුතු අතර යම් අලාභානියක් සිදු වුවහොත් එම අලාභ හානිවල වටිනාකම අයකර ගැනීමට කටයුතු කරනු ඇත.

20. රාජකාරි අවශ්‍යතාවය සඳහා ගාල්ල වරාය තුළ ඇති බංගලාවේ පමණක් කාමර ඉල්ලුම් කළ හැකි අතර ඒ සඳහා කළමනාකාර අධ්‍යක්ෂගේ අනුමැතිය මත ගාස්තු අයකිරීමකින් තොරව කාමර වෙන් කිරීම සිදු කරනු ලබයි. SLM 3 හා ඊට ඉහළ නිලධාරීන්ට රාජකාරි අවශ්‍යතාවයන් සඳහා අදාළ අධ්‍යක්ෂවරයාගෙන් හෝ අතිරේක කළමනාකාර අධ්‍යක්ෂවරයාගෙන් හෝ කළමනාකාර අධ්‍යක්ෂකගේ අනුමැතිය මත බංගලාවල කාමර වෙන් කර ගත හැකිය.

21. නිවාඩු නිකේතනවල කාමර තුළ හා විශ්‍රාම ශාලා තුළ මත්පැන් පානය කිරීම/ දුම්බීම සපුරා තහනම් වේ.

22. නිවාඩු නිකේතනවල කාමර/ශාලා වෙන් කරනු ලබන්නේ සියළුම අවශ්‍යතාවයන් නිසි පරිදි සම්පූර්ණ කිරීමෙන් පසු ගාස්තු ගෙවීමෙන් අනතුරුව වේ.

23. කාමර/ශාලාවල නවාතැන් ගනු ලබන අය ඉහත සඳහන් නීති රීති උල්ලංඝනය කර ඇති බවට වාර්තා වුවහොත් ඉදිරි කාලයේදී ඒ අය සඳහා මෙම පහසුකම් ලබා නොදීමටත් අවස්ථානුකූලව අවශ්‍ය පියවර ගැනීමටත් කටයුතු කරනු ලැබේ.

24. නිවාඩු නිකේතනවල/සංචාරක බංගලාවල කාමර/ශාලා සඳහා අයකරනු ලබන ගාස්තු පහත පරිදි වේ.

| අනු අංකය | නිවාඩු නිකේතනය | වරාය අධිකාරියේ හා වරාය අමාත්‍යාංශයේ සේවයේ නියුතු නිළධාරි/සේවකයින් සඳහා | වරාය අධිකාරියේ විශ්‍රාම ගිය නිළධාරි/සේවකයින් සඳහා | වරාය අධිකාරිය හා සෘජු සම්බන්ධතාවයක් ඇති රාජ්‍ය ආයතනවල නිලධාරීන් සඳහා |
|---|---|---|---|---|
| 01. | ආකස්ලූට් (ගාල්ල කොටුව) | විෂයභාර අමාත්‍යවරයා, නියෝජ්‍ය අමාත්‍යවරයා, අමාත්‍යාංශ ලේකම්, අතිරේක ලේකම්, වරාය අධිකාරියේ සභාපති, උප සභාපති හා කළමනාකාර | | එක් රාත්‍රියකට රු. 50,000/- (මුළු බංගලාව ලබා ගත යුතුය) |

| අනු අංකය | නිවාඩු නිකේතනය | වරාය අධිකාරියේ හා වරාය අමාත්‍යාංශයේ සේවයේ නියුතු නිළධාරි/සේවකයින් සඳහා | වරාය අධිකාරියේ විශ්‍රාම ගිය නිළධාරි/සේවකයින් සඳහා | වරාය අධිකාරිය හා සෘජු සම්බන්ධතාවයක් ඇති රාජ්‍ය ආයතනවල නිලධාරීන් සඳහා |
|---|---|---|---|---|
| | | අධ්‍යක්ෂකට මුළු බංගලාවම එක් රාත්‍රියකට රු. 10,000/- | | |
| 02. | රුමස්සල VVIP | අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහාකර ලේකම්වරු හා ඒ ආශ්‍රිත ශ්‍රේණිවල නිලධාරීන්, වරාය අධිකාරියේ කොට්ඨාශ ප්‍රධානී හා ඊට ඉහළ නිලධාරීන්ට මුළු බංගලාවම එක් රාත්‍රියකට රු. 5,000/- | විශ්‍රාම ගන්නා ලද කොට්ඨාශ ප්‍රධානීන් හා ඊට ඉහළ නිලධාරීන් සඳහා එක් රාත්‍රියකට මුළු බංගලාවට රු. 10,000/- | එක් රාත්‍රියකට රු. 20,000/- (මුළු බංගලාව ලබා ගත යුතුය) |
| 03. | රුමස්සල<br>SLM 3 වැටුප් කාණ්ඩය හා ඊට ඉහළ නිලධාරීන්ට වෙන්කර ඇති | වරාය අධිකාරියේ SLM3 වැටුප් කාණ්ඩයේ හා ඊට ඉහළ නිලධාරීන්ට, අමාත්‍යාංශයේ අධ්‍යක්ෂවරුන් හා ඊට ඉහළ නිළධාරීන්ට එක් රාත්‍රියකට එක් කාමරයකට රු. 150.00 බැගින් කාමර දෙකක් හා අමතර කාමර සඳහා රු.1,000.00 බැගින් | විශ්‍රාම ගන්නා ලද SLM3 වැටුප් කාණ්ඩයේ හා ඊට ඉහළ නිළධාරීන් සඳහා එක් රාත්‍රියකට එක් කාමරයකට රු.1,500/- බැගින් | රු. 5,000/- (එක් රාත්‍රියකට එක කාමරයකට ) |
| 04. | කතරගම අංක 01<br>SLM 3 වැටුප් කාණ්ඩය හා ඊට ඉහළ නිලධාරීන්ට වෙන්කර ඇති | වරාය අධිකාරියේ SLM3 වැටුප් කාණ්ඩයේ හා ඊට ඉහළ නිලධාරීන්ට, අමාත්‍යාංශයේ අධ්‍යක්ෂවරුන් හා ඊට ඉහළ නිළධාරීන්ට එක් රාත්‍රියකට එක් කාමරයකට රු. 150.00 බැගින් කාමර දෙකක් හා අමතර කාමර සඳහා රු.1,000.00 බැගින් | විශ්‍රාම ගන්නා ලද SLM3 වැටුප් කාණ්ඩයේ හා ඊට ඉහළ නිළධාරීන් සඳහා එක් රාත්‍රියකට එක් කාමරයකට රු.1,500/- බැගින් | එක් රාත්‍රියකට එක් කාමරයක් රු. 5,000/- බැගින් |
| | කතරගම අංක 02<br>නිලධාරීන්ට හා සේවකයින්ට වෙන් කර ඇත. | වරාය අධිකාරියේ හා අමාත්‍යාංශ නිළධාරි/සේවකයින්ට එක් රාත්‍රියකට එක් කාමරයකට රු. 150.00 බැගින් කාමර දෙකක් හා අමතර කාමර සඳහා රු.1,000.00 බැගින් ශාලාව එක් දිනකට රු.1,000.00 | විශ්‍රාම ගන්නා ලද නිළධාරි/සේවකයින්ට එක් රාත්‍රියකට එක් එක් කාමරයකට රු..1,000/- බැගින් | එක් රාත්‍රියකට එක් කාමරයකට රු..2,000/- බැගින් |

| අනු අංකය | නිවාඩු නිකේතනය | වරාය අධිකාරියේ හා වරාය අමාත්‍යාංශයේ සේවයේ නියුතු නිළධාරි/සේවකයින් සඳහා | වරාය අධිකාරියේ විශ්‍රාම ගිය නිළධාරි/සේවකයින් සඳහා | වරාය අධිකාරිය හා සෘජු සම්බන්ධතාවයක් ඇති රාජ්‍ය ආයතනවල නිලධාරීන් සඳහා |
|---|---|---|---|---|
| 05. | නුවරඑළිය අංක 01<br><br>SLM 3 වැටුප් කාණ්ඩය හා ඊට ඉහළ නිලධාරීන්ට වෙන්කර ඇති | වරාය අධිකාරියේ SLM3 වැටුප් කාණ්ඩයේ හා ඊට ඉහළ නිලධාරීන්ට, අමාත්‍යාංශයේ අධ්‍යක්ෂවරුන් හා ඊට ඉහළ නිළධාරීන්ට එක් රාත්‍රියකට එක් කාමරයකට රු. 150.00 බැගින් කාමර දෙකක් හා අමතර කාමර සඳහා රු.1000.00 බැගින් | විශ්‍රාම ගන්නා ලද SLM3 වැටුප් කාණ්ඩයේ හා ඊට ඉහළ නිළධාරීන් සඳහා එක් රාත්‍රියකට එක් කාමරයකට රු.2,000/- බැගින් | එක් රාත්‍රියකට එක් කාමරයකට<br>රු. 6,500/- |
| | නුවරඑළිය අංක 02<br><br>නිලධාරීන්ට හා සේවාකයින්ට වෙන් කර ඇත. | නිළධාරි/සේවකයින්ට එක් රාත්‍රියකට එක් කාමරයකට රු. 150.00 බැගින් කාමර දෙකක් හා අමතර කාමර සඳහා රු.1,000.00 බැගින් | විශ්‍රාම ගන්නා ලද නිළධාරි/සේවකයින්ට එක් රාත්‍රියකට එක් එක් කාමරයකට රු.2,000/- බැගින් | එක් රාත්‍රියකට එක් කාමරයකට<br>රු.6,500/- බැගින් |
| 06. | ඔලුවිල් අංක 01<br><br>SLM 3 වැටුප් කාණ්ඩය හා ඊට ඉහළ නිලධාරීන්ට වෙන්කර ඇති | වරාය අධිකාරියේ SLM3 වැටුප් කාණ්ඩයේ හා ඊට ඉහළ නිලධාරීන්ට, අමාත්‍යාංශයේ අධ්‍යක්ෂවරුන් හා ඊට ඉහළ නිළධාරින් සඳහා එක් රාත්‍රියකට එක් කාමරයකට රු. 150.00 බැගින් කාමර දෙකක් හා අමතර කාමර සඳහා රු.1,000 /- බැගින් | විශ්‍රාම ගන්නා ලද SLM3 වැටුප් කාණ්ඩයේ හා ඊට ඉහළ නිළධාරීන්ට එක් රාත්‍රියකට එක් කාමරයකට රු.1,500/- බැගින් | එක් රාත්‍රියකට එක් කාමරයකට<br>රු. 5,000/-. බැගින් |
| | ඔලුවිල් අංක 02<br><br>නිලධාරීන්ට හා සේවකයින්ට වෙන් කර ඇත. | නිළධාරි/සේවකයින්ට එක් රාත්‍රියකට එක් කාමරයකට රු. 150.00 බැගින් කාමර දෙකක් හා අමතර කාමර සඳහා රු.1000.00 බැගින් | විශ්‍රාම ගන්නා ලද නිළධාරි/සේවකයින්ට එක් රාත්‍රියකට එක් එක් කාමරයකට රු රු.1,000/- බැගින් | එක් රාත්‍රියකට එක් කාමරයකට<br>රු. 3,000/- බැගින් |
| 07. | ත්‍රිකුණාමලය අංක 01<br><br>SLM 3 වැටුප් කාණ්ඩය හා ඊට ඉහළ නිලධාරීන්ට වෙන්කර ඇති | වරාය අධිකාරියේ SLM3 වැටුප් කාණ්ඩයේ හා ඊට ඉහළ නිලධාරීන්ට, අමාත්‍යාංශයේ අධ්‍යක්ෂවරුන් හා ඊට ඉහළ නිළධාරීන්ට එක් රාත්‍රියකට එක් කාමරයකට රු. 150.00 බැගින් කාමර දෙකක් හා | විශ්‍රාම ගන්නා ලද SLM3 වැටුප් කාණ්ඩයේ හා ඊට ඉහළ නිළධාරීන්ට එක් රාත්‍රියකට එක් කාමරයකට රු..1,500/- බැගින් | එක් රාත්‍රියකට එක් කාමරයකට<br>රු. .5,000/- බැගින් |

| අනු අංකය | නිවාඩු නිකේතනය | වරාය අධිකාරියේ හා වරාය අමාත්‍යාංශයේ සේවයේ නියුතු නිළධාරි/සේවකයින් සඳහා | වරාය අධිකාරියේ විශ්‍රාම ගිය නිළධාරි/සේවකයින් සඳහා | වරාය අධිකාරිය හා ඍජු සම්බන්ධතාවයක් ඇති රාජ්‍ය ආයතනවල නිලධාරීන් සඳහා |
|---|---|---|---|---|
| | ත්‍රිකුණාමලය අංක 02 | අමතර කාමර සඳහා රු.1,000.00 බැගින්<br><br>නිළධාරි/සේවකයින්ට එක් රාත්‍රියකට එක් කාමරයකට රු. 150.00 බැගින් කාමර දෙකක් හා අමතර කාමර සඳහා රු.1000.00 බැගින් | විශ්‍රාම ගන්නා ලද නිළධාරි/සේවකයින්ට එක් රාත්‍රියකට එක් එක් කාමරයකට රු රු.1,000/- බැගින් | එක් රාත්‍රියකට එක් කාමරයකට රු. .3,000/- බැගින් |

SLM 3 හා ඊට ඉහළ නිලධාරීන්ට රාජකාරී අවශ්‍යතාවයන් සඳහා බංගලාවල කාමර 02 ක් සඳහා රු. 75/- බැගින් අය කර ගනු ලබන අතර වැඩිපුර ලබා ගන්නා කාමරයකට රු. 500/- ක් අය කර ගනු ලැබේ.

- **සැ.යු.:** ඉහත ගාස්තු සඳහා SSCL හා VAT එකතු කරනු ලැබේ.

**අද්මිරාල් එස් එස් රණසිංහ (විශ්‍රාමික)**
**සභාපති**

2025.04.16 දින